

# දිදුලන මිණිමුතු මෙහි කැන්දන මෙල්බන් රූපවාහිනී මුතුහර



සිසිර දිසානායක

අපි දරුවන් පිළිබඳව කතා කරන්නෙමු. ඒ, අප ඔවුනට දක්වන අසීමිත සෙනෙහස නිසාය. අප බොහෝ දෙනෙකු මව් බිම හැර ද මෙහි පැමිණියේ දරුවන් නිසයි.

අපි මව් බිම පිළිබඳ ව කතා කරන්නෙමු. ඒ, අප මව් බිමට දක්වන අපමණ වූ බැඳීම් නිසයි. මව් බිමේ අපගේ දේ කෙරෙහි ඇති ආශක්ත බව නිසයි.

අපි මෙහි පැමිණි අපටත්, අපගේ දරුවන්ටත් මඟ හැරී යන බොහෝ දේ වෙතැයි පසුතැවිලි වූයෙමු. තාක්‍ෂණයේ පිහිටෙන් ඒවා අවම කරගන්නට දැන් අපි සමත්වෙමින් සිටින්නෙමු.

වසර 1982 පෙබරවාරි 15 ද මව්බිමේ ජාතික රූපවාහිනිය ඇරඹිණ. එහි මුල් ම සභාපතිවරයා වූ එම්.ජේ. පෙරේරා මැතිතුමාගේ අදහසක් වූයේ දරුවන් වෙනුවෙන් යමක් කළ යුතු බවයි. ඊට නව අදහසක් එක් කරමින් එවකට නිෂ්පාදකවරියක ලෙස සේවය කළ ආචාර්ය ලලිතා සිරිබද්දන මැතිණිය "මුතුහර" ළමා සමාජය නිර්මාණය කර පිහිටවීමට මූලිකව කටයුතු කළාය. ඒ අනුව, වසර 1982 අප්‍රේල් 27 ද පොල්ගහවෙල අංක 1 මුතුහර ළමා සමාජය පිහිටවිණ.

මුතුහර ළමා සමාජය අද වන විට අන්තර්ජාතික තත්ත්වයෙන් පවත්වාගෙන යන, අග්නි දිග ආසියාවේ ඇති විශාලත ම ළමා සමාජ ජාලය බවට පත් වී ඇත්තේය. මුල් ම අන්තර්ජාතික මුතුහර ළමා සමාජය පිහිටවනු ලැබූයේ සිඩ්නි නුවරයි. අංක 2514 වන, අප මෙල්බන් රූපවාහිනී මුතුහර ළමා සමාජය දෙවන අන්තර්ජාතික මුතුහර ළමා සමාජයයි. ලැබුවා වූ 2016 නව වසරේ මෙල්බන් මුතුහර සිය අංග ලෙස සමාජ සත්කාරයකුත්, ස්වතන්ත්‍ර නිර්මාණයකුත් දියත් කිරීමට සැරසෙයි. ඒ පිළිබඳව පිළිසඳරක යෙදීමට අපි එහි ප්‍රධාන සංවිධායිකාව සහ උපදේශිකාව වන වත්සලා දසනායක ඉෂ්ටවීර මහත්මියට ඇරයුම් කළෙමු.

"අපේ මව් බිමේ ප්‍රථම වතාවට මුතුහර සාමාජික සාමාජිකාවන් අතරින් ගායන හැකියාවන් ඇති සැබෑ දක්‍ෂයින් නියමාකාරයෙන් හඳුනාගෙන ඔවුන්ව දිරිමත් කරන තරගයක් පැවැත්වූවා. "දිදුලන මිණිමුතු" නම් වූ මේ තරගයේ ජයග්‍රාහකයින් තේරුවේ එස්. එම්. එස්. පණිවිඩ වලින් නෙවෙයි. උගත් විනිශ්චය මණ්ඩලයක තීරණ මත පිහිටීමෙන් පමණයි," ඉෂ්ටවීර මහත්මිය අප හා දුරකථනයෙන් එක් වූවා ය.

මුතුහර ළමා සමාජයේ වර්තමාන නිෂ්පාදක උදන්ත කමල් ගුණතිලක මහත්මා "දිදුලන මිණිමුතු" පිළිබඳ අදහස් දක්වමින් ඉෂ්ටවීර මහත්මිය වෙත ශ්‍රී ලංකාවේ සිට ලබාදුන් පණිවිඩයේ හැඳින්වීම මෙහිලා සටහන් කරනු වටියි;

"සැබෑ ශ්‍රී ලාංකේය ළමා හඬ සොයා යන සෞන්දර්ය චාරිකාවයි "දිදුලන මිණිමුතු." මෙහි ශ්‍රී ලාංකේය, විශේෂයෙන් ම මුතුහර දරු දැරියන් තුල සාමූහිකත්වය, සහෝදරත්වය, අභියෝග ජයගැනීමේ ශක්තිය හා ධෛර්ය වැඩිවීම, තමා පමණක් නොව අනෙක් අයව ද ජයග්‍රහණයට පොළඹවා ගැනීම යන ගුණාංග වඩවමින් නිසි ප්‍රමිතියකින් යුතුව දරුවන්ගේ රසවින්දනය යහපත් දිශානතියකට හැරවීමට මෙම වැඩසටහන උපස්ථම්භක වූ බව අපගේ වැටහීමයි..."

අපි වත්සලා ඉෂ්ටවීර මහත්මිය වෙත නැවත යොමු වෙමු. "කණිෂ්ඨ සහ ජ්‍යේෂ්ඨ අංශ දෙකෙන් ජයග්‍රාහකයින් මේ තරගයෙන් තෝරාගෙන සහතික සහ තිළිණ පත් ප්‍රධානය කෙරුණා. ඒ අතරින් කණිෂ්ඨ සහ ජ්‍යේෂ්ඨ අංශ දෙකේ ප්‍රථම ස්ථාන මීරිගම මුතුහර ළමා සමාජයේ රවිඳු සත්සර දරුවාත් හොරණ පොකුණුවිට මුතුහර ළමා සමාජයේ නයන සුදීප්ත දරුවාත් දිනා ගත්තා. "දිදුලන මිණිමුතු" අවසාන මහා තරගය සඳහා අප ළමා සමාජයත් මෙල්බන් සිට සහභාගී වුනා. ඒ සහභාගීත්වය සිදු වුනේ දෙවිදිහකට. මුලින් ම, තරගයේ ජයග්‍රාහකයින්ට සුභ පතා විශේෂයෙන් ලියැවුණු ගීතයක් ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයට අප සමාජයේ දරු දැරියන් විසින් ගායනා කර මෙහිදීම රූප ගත කෙරුනා. මේ ගීත නිර්මාණය අවසන් මහා තරගයේ දී ප්‍රචාරය කිරීම සඳහා ලබා දුන්නා. "මුතු තැල්ල ඔබයි මුතුහරේ බැඳී නෙක දිදුලන මිණිමුතු අතරේ..." නම් වූ මෙම ගීතය තවමත් ජාතික රූපවාහිනියේ විටින් විට ප්‍රචාරය වෙනවා. ඒක මෙල්බන් මුතුහර දරුවන් ලැබූ විශේෂ ජයග්‍රහණයක්."

"දෙවැන්න සිදුවන්නේ තව මාස කිහිපයකින්. ඒ තමයි, තරගයෙන් ජයග්‍රහණය කරපු දරුවන් දෙදෙනාට මෙල්බන් නුවර දින දහයක අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කිරීම. මෙය විශේෂයෙන්ම දෙරටේ වෙසෙන මුතුහර දරුවන්ගේ ජාත්‍යාන්තර සබඳතාව වැඩි දියුණු කිරීම වෙනුවෙන් ගන්නා උත්සහයක්. තවත් විදිහකින් සමාජ සත්කාරයක්. මෙල්බන් වලින් පස්සේ මේ දෙන්නා තවත් දින දහයක සංචාරයකට සිඩ්නි නුවරටත් යනවා."

මුතුහර ළමා සමාජයක ම සාමාජිකයෙකු ලෙසින් උදන්ත කමල් ගුණතිලක නිෂ්පාදකයා ඒ පිළිබඳව අදහස් දක්වන්නේ මෙලෙසින්;

"දිදුලන මිණිමුතු" තුළින් ඉතා ජවසම්පන්න, ප්‍රතිභාසම්පන්න දරුවන් දෙදෙනෙකු තෝරා ගැනීමට අපට හැකි වුණා. ඒ වෙනුවෙන් අපේ දෙවන අන්තර්ජාතික මුතුහර ළමා සමාජය වන මෙල්බන් මුතුහර ළමා සමාජය දක්වන අනුග්‍රහය පිළිබඳව අපි අතිශයෙන් ම සතුටට පත් වෙනවා. විශේෂයෙන් ම එහි ප්‍රධාන සංවිධායකවරිය වන වත්සලා ඉෂ්ටවීර මහත්මිය රූපවාහිනියේ නීති රීති වලට එකඟව හොඳින් සංවිධාන කටයුතු කරගෙන යන එක සතුටට කාරණයක්. මේ සියල්ල වෙනුවෙන් අපගේ දරුවන්ගේ, දෙමව්පියන්ගේ, වැඩිහිටියන්ගෙත් ගෞරවනීය ස්තූතිය ඇයටත්, මෙල්බන් මුතුහර ළමා සමාජයටත්, මේ සත්කාරය සඳහා නන් අයුරින් දායක වන දෙමව්පිය වැඩිහිටියන්ටත් හිමි වෙනවා."
අපි ඉෂ්ටවීර මයත්මිය සමඟ පිළිසඳරට නැවතත් එක් වූයෙමු.



"මුතුහර දරු දෙදෙනාගේ සංචාරයේ පූර්ණ භාරකාරත්වය ගන්නේ රූපවාහිනී සංස්ථාවයි. ඒ නිසා, මේ සංචාරයේ දී ජාතික රූපවාහිනීයේ ළමා ඒකකයේ ප්‍රධානියෙකුත් අධ්‍යාපන ඒකකයේ ප්‍රධානියෙකුත් එක් වෙනවා. ඔවුන් මෙල්බන් ගත කරන කාලයේ දී මෙල්බන් මුතුහර දරු දැරියන් වෙනුවෙන් වටිනා වැඩමුළු කිහිපක් පවත්වනවා. ඒ වගේ ම, මෙල්බන් සංචාරයේ සියළු තොරතුරු ජාතික රූපවාහිනියේ ප්‍රවෘත්ති විකාශ තුළින් ඉදිරිපත් කිරීමට රූපවාහිනී අධ්‍යක්‍ෂක ජනරාල්තුමාගේ අවසරය ලැබී තිබෙනවා. ඔවුන් කියන විදියට අවුරුදු 33 කට පස්සේ රූපවාහිනි ඉතිහාසයේ ප්‍රථම වරට සිදුවන විශේෂ දෙයක් තමයි මෙවැනි තරගයකින් ජය ලැබූ දරුවන් දෙදෙනෙකුට ඕස්ට්‍රේලියාව වැනි රටක විදේශ සංචාරයක් සංවිධානය වීම."

ජාතික රූපවාහිනී ළමා ඒකකයේ සහකාර අධ්‍යක්‍ෂක, පත්මසිරි ප්‍රනාන්දු මහතා ද මේ වෙනුවෙන් විශේෂ පණිවිඩයක් අප වෙත එවා තිබුනේ මෙසේයි;

"මුතුහර යනු හුදු රූපවාහිනී වැඩසටහනක් පමණක් නොවෙයි. එය, අපේ දරුවන්ට ලාංකේය බව, සිංහලකම, අපේ සංස්කෘතිය, අපේ රටාව සහ මුතුහර තේමා ගීයේ කියැවෙන ආකාරයට විශ්වයේ එහා පැත්තට ම යා හැකිවන සේ දරුවන්ගේ නැණ නුවන පාදන විශාල ව්‍යාපෘතියක්. එමෙන්ම, මුතුහර කියන්නේ ජාතික රූපවාහිනීයට තිබෙන ලොකුම සම්පතයි, ඒ වගේම ආභරණයයි. මේ සම්පතත්, ආභරණයත් කිසි විටෙක ආයුධයක් කර ගන්න එපා. එය නිධානයක් ලෙස රැකිය යුතුයි."

ප්‍රනාන්දු මහතා මෙල්බන් මුතුහර ළමා සමාජය ගැන ද දරන්නේ මෙවැනි ආකල්පයක්;
"මෙල්බන් මුතුහර සමාජයේ දරුවෝ රූපවාහිනී තිරයේ දැකපු අවස්ථා අඩුයි. නමුත්, ලංකාවේ සමහර වර්තමාන මුතුහර ළමා සමාජ සමඟ සසැඳුනු විට ඒවායින් ඔබ්බට ගොස් මෙල්බන් ළමා සමාජය එහි දරුවන් වෙනුවෙන් විවිධ වැඩමුළු සහ ව්‍යාපෘති පවත්වමින් ක්‍රියාශීලීව කටයුතු කරන බව සනාථ වී හමාරයි. මේ නිසයි, මුතුහර හුදු රූපවාහිනී වැඩසටහනක් පමණක් නොවෙයි කියන්නේ."

මෙම සමාජ සත්කාරයට අමතරව 2016 වසර අගදී එළිදැක්වීමට යන නවතම මෙල්බන් මුතුහර නිර්මාණය පිළිබඳව ද වත්සලා ඉෂ්ටවීර මහත්මිය අපව දැනුවත් කළාය. .

"අපි වසර දෙකකට වරක් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති යටතේ, මේ වසර අගදී, අලුත් ම ළමා නාට්‍යයක් ඉදිරිපත් කරන්න සූදානම් වෙනවා. වැඩමුළු පවත්වමින් අපට උදව්කරන කුසුම්සිරි, යශෝධරා සරච්චන්ද්‍ර ප්‍රවීණ රංගවේදීන් දෙපළ තමයි මේ කටයුත්තට උර දෙන්නේ. සෑම සියළු දෙයක් ම දරුවන් අතින් ම ඉදිරිපත් කරවන්නයි අපේ මේ උත්සහය. අන්තර්ජාතික ළමා සමාජයක් හැටියට, විශේෂයෙන් ම එසේ කරන නිර්මාණයක ප්‍රමිතිය රැක ගැනීමත් ඉතාම වැදගත්. මුතුහර නිර්මාණයේ දී, ආචාර්ය ලලිතා සිරිබද්දන මැතිණියට අවශ්‍ය වුනේ ළමයින් වැඩිහිටියන් නොකර, ළමයින්ගේ ළමා කාලය අර්ථවත් ලෙස ගත කළ හැකි, ඔවුන්ගේ හැකියාවන් ඉස්මතු කළ හැකි තැනක් නිර්මාණය කිරීමයි. දෙවන ජාත්‍යාන්තර මුතුහර ළමා සමාජයේ ප්‍රධාන සංවිධායිකාව ලෙස ඒ අවශ්‍යතාවය නොපිරිහෙළා ඉටු කරන්න මම කැප වෙලා ඉන්නවා."

ඇය දුරකතන පිළිසඳර නිමා කළාය.
අපි මෙල්බන් මුතුහර ළමා සමාජයේ ඉදිරි කටයුතු වලට අපගේ සුභාශිංසන එක් කරන්නෙමු.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com